# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1689/9 – 2011 ජනවාරි 18 වැනි අඟහරුවාදා – 2011.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/237(2).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ඉහළ බියන්විල ගමෙහි පිහිටි කඩවත නගරය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් ගම්පහ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.ගම් 3702 සහ 2010.01.11 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 14, 17, 18, 19, 20 දක්වා පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0125 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි පහ (05).

**කැබලි අංක 14**

ඉඩමේ නම: නොදනී; විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0049.

**කැබලි අංක 17**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක; විස්තරය: ගණේමුල්ල පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. එම්. බන්දුල, 10/1ඒ, පෙරේරා මාවත, පානදුර; ප්‍රමාණය: හෙක්. 0.0016.

**කැබලි අංක 18**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක; විස්තරය: ගණේමුල්ල පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. එම්. බන්දුල, 10/1ඒ, පෙරේරා මාවත, පානදුර; ප්‍රමාණය: හෙක්. 0.0021.

**කැබලි අංක 19**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක; විස්තරය: ගණේමුල්ල පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. එම්. බන්දුල, 10/1ඒ, පෙරේරා මාවත, පානදුර; ප්‍රමාණය: හෙක්. 0.0019.

**කැබලි අංක 20**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක; විස්තරය: ගණේමුල්ල පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විශාකා චන්ද්‍රසේකර, වරි. අංක 15, ගනේමුල්ල පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0020.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් පහත සඳහන් දිනයේදී පහත සඳහන් වේලාවට බියගම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

| දිනය | කැබලි අංක | වේලාව |
|---|---|---|
| 2011.02.23 | 14 සිට 20 | පෙ.ව. 10.00 |

තවද, 2011 පෙබරවාරි මස 09 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ටී. ඩී. එස්. පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
බියගම

2011 ජනවාරි මස 07 වැනි දින,
සපුගස්කන්ද, මාකොළ,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

02 - 36

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 3/6/02/15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:
එල්ඩී/05/2008/ඩබ්එස්/160.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සූරියපුර සුළු කොට්ඨාශයේ, සූරියපුර ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද 2010.12.13 දිනැති අ.භූ.පි. අංක 2 අතිරේක අංක 167 පත්‍ර අංක 504 දරන පිඹුරේ කැබලි අංක 9368 වශයෙන් දැක්වෙන "චූන්ඩන්කාඩු හෙවත් සූරියපුර" නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.8085 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංක 9368**
ඉඩමේ නම: චූන්ඩන්කාඩු හෙවත් සූරියපුර; ප්‍රමාණය: හෙක්. 0.8085.

**මායිම්**
උතුරට: කැබලි අංක 9569 හා කැබලි අංක 9369 මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: කැබලි අංක 9369, පාර (මා.සං.අ.) සහ කැබලි අංක 9369 (බැම්ම); දකුණට: කැබලි අංක 9369 (බැම්ම) සහ කැබලි අංක 9369; බටහිරට: කැබලි අංක 9369.

හිමිකම් කියන අය: ඒ. ආර්. කේ. බණ්ඩා මහතා, එච්. එම්. පොඩිමැණිකේ මිය බාරේ, ජයසේකර ස්ටෝර්ස්, පොටන්කාඩු හංදිය, කන්තලේ, සහ තවත් අය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 මාර්තු මස 07 දින පෙ.ව. 10.30 සිට කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 පෙබරවාරි මස 28 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්.
කන්තලේ.

2011 ජනවාරි මස 13 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

02 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.